බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරලේ අඹතලෙන් පහල කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වෝඩ් අංක 04 ගොතටුව පිහිටි වරිපනම් අංක 104/25 "බටලන්දහේන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 1990 මාර්තු 07 දාතම හා අංක 1121 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 7 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක P Pco 607 දරන පිඹුරේ ලොට් 6 නැගෙනහිරට : බී. විලියම් පෙරේරා සහ වෙනත් අයගේ හල්ගහවෙල කුඹුර, දකුණට : අංක 1121 දරන පිඹුරේ ලොට් 7 බී සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (අක්. 0 රූඩ් 0 පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1121 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 962/40 කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

සර්වේයර් ජනරාල් විසින් සාදන ලද 1969 ඔක්තෝබර් මස 10 දාතම හා අංක PPCo 607 දරන පිඹුරේ නිරූපිත ලොට් 15 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

12-129/2

---

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ජේ. කේ. මුණසිංහ.
ගිණුම් අංක : 1007 5045 7783.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2009 ක් වූ මැයි මස 28 වැනි දින සීමාසහිත සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 9133 ප්‍රකාර රුපියල් පන් ලක්ෂ අනූපන් දහස් හාරසිය විසිතුනයි ශත හතලිස් තුනක (රු. 5,95,423.43) මුදල ද, 2008 ඔක්තෝබර් මස 29 දින සිට අංක 9133 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන් ලක්ෂ හතලිස් තුන් දහස් හාරසිය තිස් දෙකයි ශත පහළොවක (රු. 5,43,432.15) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම, සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.09.30 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.04.20 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.12.29 දින පෙ. ව. 11.00 ට

දේපළ පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර , ගඟපළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාම්පිටිය (දැන් තොටදෙණිය) හන්දෙස්ස හි පිහිටි "මාම්පිටිය වලව්වේවත්ත කොටසක් හෙවත් කටුකැලේ වත්ත දැන් කිතුල්දෙණිය එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. එස්. සන්ගරන්දෙණිය විසින් සාදන ලද 2005 පෙබරවාරි මස 07 දාතම හා අංක 4393 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට සහ උතුරට : එකී පිඹුරේ නිරූපිත පාර, නැගෙනහිරට : කේ. දිසානායක යන අයට අයිති දේපළ, දකුණට : එකී පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : පිඹුරු අංක 2905 හි ලොට් එෆ් වශයෙන් ලකුණු කොට ඇති කිතුල්දෙණිය වත්තෙන් කොටසක් යන මායිම් තුළ පිහිටි විශාල ඉඩම් කොටස සමග පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද වෙළුම/පත්ඉරුව සී 327/267 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

12-129/3

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ජේ. කේ. මුණසිංහ,
ගිණුම් අංක : 1007 5045 7783.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009ක් වූ මැයි මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑහතර දහස් හත්සිය තිස් හතරයි ශත පනස් හතක (රු. 1,374,734.57) මුදල ද, 2008 ඔක්තෝබර් මස 29 වැනි දින සිට අය විය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොලොස් ලක්ෂ අනූදහස් අටසිය හයයි ශත තිස්අටක (රු. 1,290,806.38) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතරක් (14%) බැගින් වූ පොළිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම, සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.09.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2011.09.06 වැනි දින "දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් " දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.12.29 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ගඟපළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාම්පිටිය (දැන් තොටදෙණිය) පිහිටි "මාම්පිටිය වලව්වේවත්ත නොහොත් කටුකැලේවත්ත දැන් කිතුල්දෙණිය එස්ටේට්" හි කොටසක් යයි කියනු ලබන ඉඩමෙන් බලයලත් මානක තැන ටී. බී. එස්. සංගරන්දෙනිය විසින් සාදන ලද 2005 පෙබරවාරි මස 07 දාතම හා අංක 4393 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමානිර්ණය කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 01, නැගෙනහිරට (වඩා නිවැරදිව ඊසානට) : කේ. දිසානායක යන අයට අයිති දේපළ (බලයලත් මානක තැන කේ. එන්. එස්. වෛද්‍යරත්න) යන අය විසින් සාදන ලද 1980 නොවැම්බර් මස 01 දාතම හා අංක 3 දරන පිඹුරේ ලොට් 5න් කොටසක්), දකුණට : (වඩා නිවැරදිව ගිණිකොණට) දවුලගල සිට පේරාදෙණිය දක්වා පාර සහ බස්නාහිරට (වඩා නිවැරදිව නිරිතට) පිඹුරු අංක 2905 ක්ෂෙත්‍ර අංක 3 හා සබැඳිව ලොට් එෆ් වශයෙන් ලකුණු කොට ඇති කොටස කිතුල්දෙණිය වත්තෙන් කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් පහක් (අ. 0 රූ. 1 පර්. 35) විශාල ඉඩම් කොටස සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව සී 327/254 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

12-129/4

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කෝට්ටේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.12.06 දිනැති අංක 3031 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ජාගොඩ ආරච්චිගේ සුනිල් පියවර්ධන, සහ චන්ද්‍රා පියවර්ධන (ඉන්පැක්ට් ඇන්ඩ් එස්. පී. ඇසෝසියේට්ස් යන නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන) අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින ප.ව. 3.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ 1* .- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල ඒකකය තුළ හෝකන්දර ගමෙහි පිහිටි ගොඩපොරගහලන්ද නමැති ඉඩමට,

බලයලත් මානක ටී. බී. අත්තානයක විසින් 2006.10.15 වැනි දින මැන සාදන ලද අංක එම් 2105 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 10.20.

*දේපළ 2* .- ඉහත කී හෝකන්දර ගමෙහි පිහිටි බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද ඉහත කී අංක එම් 2105 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "බී" ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 10කි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.01.06 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- මෙම ඉඩමට පිවිසීම සඳහා පැලවත්ත හන්දියේ සිට (ප්‍රසිද්ධ වාණිජ මංසන්ධියක් වූ බත්තරමුල්ල, පන්නිපිටිය පාර්ලිමේන්තු පාර, අකුරේගොඩ පාර හමුවන) අකුරේගොඩ පාරේ කි. මී. 1.5 ක් පමණ ඉදිරියට ගමන් කොට. වැව පාරට දකුණට හැරී, කි. මී. 1.8ක් පමණ ගිය විට හමුවන දර්ශනීය වැව පසුකරගෙන පන්සල දක්වා ගමන් කරන්න. ඔබේ වම් අත පැත්තේ හරියටම පන්සල ඉදිරිපිටින් මිනින්දෝරු පිඹුරේ බෝගහවත්ත පාර ලෙස දක්වා ඇති අඩි 12 ක් පළල පාර ඔබට දැකගත හැකිවනු ඇත. එහි පළමු ඉඩම් කැබැල්ල ලෙස අදාළ ඉඩම ඔබට හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක්ද
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෝෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංකයඃ 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක ඃ 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය ඃ 0114-617059.

12-74

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කෝට්ටේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.10.12 දිනැති අංක 2252 සහ 2007.07.27 දිනැති අංක 2895 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම චන්ද්‍රා පියවර්ධන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින ප. ව 3.15 ට එම දේපළ පිහිටි ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය 1* :- උතුරුමැද පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ කුමාර වන්නි පළාතේ කුමාර වන්නි පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ රතඹලේ ගමෙහි පිහිටි සියඹලාගහහේන්යාය, තල්ගහහේන, විලගාවහේන්යාය සහ වැව්ඉස්මත්තේහේන නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අංක එෆ්. වී. 1824 සහ 1980.02.06 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 54 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය අක්කර විසිපහයි රූඩ් දෙකයි පර්චස් නවයක් (අ.25, රූ. 2, පර්. 9)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.- 2010.12.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.01.06 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත්ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- මෙම ඉඩමට ළඟාවීම සඳහා බංගදෙනිය හන්දියේ සිට (කොළඹ පුත්තලම් පාරේ, කොළඹ කොටුව සිට කි. මී. 87 ක් පමණ) ආනමඩුව පාරේ කි. මී. 23.5 ක් පමණ ගමන්කොට (පුත්තලම හරහා) ජයමාවතට දකුණට හැරී, කි. මී. 4 ක් පමණ රන්පොකුණ හෝටලය දක්වා ගමන් කරන්න. අදාළ වත්ත එම හෝටලයේ සිට මීටර් 100 ක් පමණ දුරකින් එම ප්‍රවේශ මාර්ගයේම වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය ඃ-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක්ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441, 0714-424478.
ෆැක්ස් අංකය : 0112-345975

12-77

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කෝට්ටේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2005.10.12 දිනැති අංක 2251 සහ 2007.07.27 දිනැති අංක 2896 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජාගොඩ ආරච්චිගේ සුනිල් පියවර්ධන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ක්වූ දෙසැම්බර් මස 21 වැනි දින පිළිවෙලින් ප.ව. 2.30 ට සහ ප.ව. 2.45 ට එම දේපළ පිහිටි ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ 1* .- උතුරුමැද පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුමාර වන්නි පළාතේ කුමාර පල්ලම් පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ රතඹලේ පිහිටි සියඹලාගහහේන්යාය, තල්ගහහේන, විලගාවහේන්යාය සහ වැව්ඉස්මත්තේහේන නමැති ඉඩමට සර්වෙයර් ජනරාල් විසින් මැන සාදන ලද අංක එෆ්.වී. 1824 ෆයිල් ෂීට් අංක 1 සහ 1966 මාර්තු මස 23 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 53 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය අක්කර දාහතරයි රූඩ් එකයි පර්චස් එකක් (අ. 14, රූ. 1, පර්. 1) වේ.

*දේපළ 2.* - ඉහත කී රතඹලේ ගමෙහි පිහිටි සියඹලාගහහේන්යාය, තල්ගහහේන, විලගාවහේන්යාය සහ වැව්ඉස්මත්තේහේන නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අංක එෆ්. වී. 1825 සහ 1966 මැයි මස 03 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 42 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් එකොළහක් (අ. 10, රූ. 2, පර්. 11)වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.12.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.01.06 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- මෙම ඉඩමට ළඟාවීම සඳහා බංගදෙනිය හන්දියේ සිට (කොළඹ පුත්තලම් පාර, කොළඹ කොටුව සිට කි. මී. 87 ක් පමණ) ආනමඩුව පාරේ කි. මී. 23.5 ක් පමණ ගමන් කොට (පුත්තලම හරහා) ජයමාවතට දකුණට හැරී. කි. මී. 4ක් පමණ රන්පොකුණ හෝටලය දක්වා ගමන් කරන්න. අදාළ වත්ත එම හෝටලයේ සිට මීටර් 100 ක් පමණ දුරකින් එම ප්‍රවේශ මාර්ගයේ ම වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස් තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441, 0714-424478.
ෆැක්ස් අංකය : 0112-345975.

12-75

## සෙලාන් බැංකුව පීඑල්සී - ගම්පහ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල ගම්පහ පදිංචි ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනවිරත්න යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් සාදන ලද 2002.04.02 දිනැති අංක 287 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යක්කල පාර වරිපනම් අංක 135 දරන කීණගහලන්ද නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 287 දරන සැලැස්ම අනුව රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 34/133 හි ලියාපදිංචි කර ඇත.

පෙර කී සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාර්ගය සඳහා වෙන් කිරීම් තුළ උඩින් හා දිගේ මාර්ග ප්‍රවේශය සමග. ඉහත සඳහන් දේපල 2011 දෙසැම්බර් මස 23 වන දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- ගම්පහ රෝහල පිහිටි මංසන්ධියේ සිට යක්කල පාර ඔස්සේ මීටර් 250 ක් පමණ ඉදිරියට ගිය විට මාර්ගයේ වම්පස ආනන්ද මාවතට ඉදිරියෙන් "නාලන් මෝටර්ස්" නමැති අදාල දේපල පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- *රජයේ ගැසට් පත්‍රයේ* 2011.09.23 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2011.09.26 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2011.11.05 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්). 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු.ක. 011-2456458, 2456480

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දු.ක. 011-3068185, 011-2572940

12-98

## සෙලාන් බැංකුව පීඑල්සී - දෙහිවල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල දෙහිවල ලින්ක්ස් ඒජන්සීස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඔලිවර් ෆ්‍රැන්සිස් ද සිල්වා හෙවත් ද සිල්වා ඔලිවර් ෆ්‍රැන්සිස් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පිඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. එම්. පීටර් ප්‍රනාන්දු විසින් සාදන ලද 1982.02.15 දිනැති අංක 973 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක ඒ 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 973 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2464/209 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින්, යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

1. පෙර කී බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 1980.12.10 දිනැති අංක 2126 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 41 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2126 දරන සැලැස්ම අනුව පර්චස් තිස්හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 37.5) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2512/151 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී බොරලැස්ගමුව පිහිටි එකී අංක 2126 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 42 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2126 දරන සැලැස්ම අනුව පර්චස් තිස්හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 36.5) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2365/241 යටතේ ලියාපදිංචි කර ඇත.

3. පෙර කී බොරලැස්ගමුව පිහිටි එකී අංක 2126 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 43 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2126 දරන සැලැස්ම අනුව පර්චස් තිස්හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 34.5) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2512/152 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2011 දෙසැම්බර් මස 16 වන දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- බොරලැස්ගමුව මංසන්ධියේ සිට පිළියන්දල පාරේ මීටර් 150 ක් පමණ ඉදිරියට ගිය විට දකුණු පසට ඇති අබේරත්න මාවතට හැරී තවත් මීටර් 600 ක් පමණ ගිය විට වම්පසට ඇති රත්නාරාම පාරට හැරෙන්න. එම මාර්ගයේ මීටර් 150 ක් පමණ ගොස් නැවතත් දකුණු පසට ඇති මාර්ගයට හැරී තවත් මීටර් 150 ක් පමණ ගිය විට දකුණු පසට

පිහිටි 3 වන පටුමඟට හැරී තවත් මීටර් 100 ක් පමණ ගිය විට වරිපනම් අංක 26/8 දරන අදාල දේපල 3 වන පටුමගේ වම්පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2009.12.04 වැනි දින පළවී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.11.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2009.12.08 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරිම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පිඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011-2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-97

---

## හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - කෝට්ටේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2008.06.20 දිනැති සහ අංක 3213 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජාගොඩ ආරච්චිගේ සුනිල් පියවර්ධන, සහ චන්ද්‍රා පියවර්ධන (ඉන්ෆැක්ට් ඇන්ඩ් එස්. පී. ඇසෝසියේට්ස් යන නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන) යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි සථානයේදී 2011 ක්වූ දෙසැම්බර් මස 19 වන දින ප.ව. 3.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල 1 :-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල ඒකකය තුල හෝකන්දර ගමෙහි වැව පාර වරිපනම් අංක 329/ඒ2 දරන ගොඩපොරගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1998.09.25 දින මැන සාදන ලද අංක 8873 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත්වේ. විශාලත්වය පර්චස් 10.

2. ඉහත කී හෝකන්දර ගමෙහි වැව පාර වරිපනම් අංක 329/ඒ3 දරන ගොඩපොරගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද ඉහත කී අංක 8873 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 4 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත්වේ. විශාලත්වය පර්චස් 10.5.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.12.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.01.06 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* මෙම ඉඩමට පිවිසීම සඳහා පැලවත්ත හන්දියේ සිට (ප්‍රසිද්ධ වාණිජ මංසන්ධියක් වූ බත්තරමුල්ල, පන්නිපිටිය පාර්ලිමේන්තු පාර, අකුරේගොඩ පාර හමුවන) අකුරේගොඩ පාරේ. කි. මී. 1.5 පමණ ඉදිරියට ගමන් කොට, වැව පාරට දකුණට හැරී. කි. මී. 1.8 ක් පමණ ගිය විට හමුවන දර්ශනීය වැව පසුකරගෙන පන්සල දක්වා ගමන් කරන්න. ඔබේ වම් අත පැත්තේ හරියටම පන්සල ඉදිරිපිටින් මිනින්දෝරු පිඹුරේ බෝගහවත්ත පාර ලෙස දක්වා ඇති අඩි 12 ක් පළල පාර වමට දැකගත හැකිවනු ඇත. එම පාරේ මද දුරක් යන විට අදාල දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංක 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156-1/13,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය : 0114-617059.

12-76

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කෝට්ටේ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනක් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2001.10.25 දිනැති සහ අංක 1541 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ජාගොඩ ආරච්චිගේ සුනිල් පියවර්ධන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ දෙසැම්බර් මස 19 වන දින පෙ.ව. 9.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල : බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටේ මහ නගර සභා සීමාව තුල නාවල වෝඩ් අංක 4, වැලිකඩ පාර්ක් පටුමගෙහි (පරණ නාවල පාරෙන් හැරී) පිහිටි වරිපනම් අංක 40ඒ සහ 40ඒ 1/1 දරන මරදන් කුරුඳුවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. කේ. තිරුනාවුකරසු විසින් 1984.03.30 දින මැන සාදන ලද අංක 3489 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ඒ. එක්ස් ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත්වේ. විශාලත්වය පර්චස් 8.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.12.24 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2011.01.07 වැනි දින ලක්බිම, ඩේලි මිරර්, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*- වැලිකඩ හන්දියේ සිට (රාජගිරිය හන්දිය නමින්ද හැඳින්වෙන) නාවල පාරේ මීටර් 100 ක් පමණ ගොස් ජයවර්ධන පුර කෝට්ටේ මහ නගර සභාවේ ප්‍රධාන ගේට්ටුවට හරි කෙලින් ඇති පාක් ලේන්" පටුමගට වමට හැරී මීටර් 250 ක් පමණ ගිය විට, අංක 40ඒ සහ 40ඒ 1/1 වරිපනම් අංක දරන මෙම දේපල පාරට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත කොළඹ 10 (දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය : 0114-617059.

12-78

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| දෙසැම්බර් | 2011.12.02 | සිකුරාදා | 2011.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.09 | සිකුරාදා | 2011.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.16 | සිකුරාදා | 2011.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.23 | සිකුරාදා | 2011.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.12.30 | සිකුරාදා | 2011.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2012** | | | |
| ජනවාරි | 2012.01.06 | සිකුරාදා | 2011.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.13 | සිකුරාදා | 2011.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.20 | සිකුරාදා | 2012.01.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.27 | සිකුරාදා | 2012.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2012.02.03 | සිකුරාදා | 2012.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.10 | සිකුරාදා | 2012.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.17 | සිකුරාදා | 2012.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.24 | සිකුරාදා | 2012.02.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.